

තාත්තාගෙන් දියණියට වටිනා
ඔවදනක්..!

දවසක් දියණියකට ඇගේ තාත්තා අපූරු පාඩමක් කියා දුන්නා.
මොකද ඇය පාසලේ යාලුවන්ගෙන් නිතරම විහිළුවට ලක්වෙන
නිසා ඇය හිත් රිදිමෙන් සිටියේ.
ඇගේ තාත්තා සූපවේදියෙක්.ඔහු ඇයව කුස්සියට එක්කරගෙන
ගිහින් ඇයට පේන්න භාජන තුනක් ලිපේ තියලා ඒ භාජන තුනටම
වතුර දැම්මා.



ඊට පස්සේ පිළිවෙලින්
පළමු භාජනේට බිත්තරයක් ද,
දෙවෙනි භාජනේට අල ගෙඩි කිහිපයක් ද,
තුන්වෙනි භාජනේට කෝපි ඇට ටිකක් ද
දාලා ටික වෙලාවක් තියෙන්න ඇරයා.







ටික වෙලාවකින් ඔහු තම දියණියට කිව්වා දැන් භාජන තුනේ තියෙන ජාති තුනට වෙලා තියෙන දේ බලන්න කියලා.




ඇගේ සූපවේදී තාත්තා ඇයට හරි අපුරුවට දෙයක් කියා දුන්නා.

දුවෙ මේ භාජන තුනේම තියෙන්නේ වතුර. ඒවා හරියට මේ සමාජය වගෙ කියලා හිතන්න. මේ බිත්තරේ, අල ගෙඩි හා කෝපි ඇට මිනිස්සු කියලා හිතන්න. මේ ගින්දර සමාජය විසින් මේ මිස්සුන්ට වෙන බලපෑම් කියලා හිතන්න.



දැන් බලමු කෝපි ඇට. ඒ කෝපි ඇට වලට කිසිම දෙයක් වෙලා නෑ. කෝපි ඇට ඒ විදියමයි. ඒත් කෝපි ඇට වල තිබුණ පාට වතුරට එකතු වෙලා. වතුර කෝපි පාට වෙලා.

සමහර මිනිස්සු ඉන්නවා එයාලට සමාජයෙන් කොයිතරම් බලපෑම් ආවත් එයලා වෙනස් වෙන්නේ නෑ. ඒ මිනිස්සු නිසා සමාජය වෙනස් වෙනවා.



# ටිකක් හිතන්න මේ කතාවෙන් ඉගෙන ගන්න තියෙන දේ....



කෙනෙක් සමාජය නිසා වෙනස් වුනොත් ඒක
තමන්ගේ ආත්ම විශ්වාස පිළිබඳ ප්‍රශ්නයක්.
ආත්ම විශ්වාසය දැඩි කෙනෙක් කවදාවත් තව
කෙනෙක්ට ඕනි විදියට වෙනස් වෙන්නේ නෑ.
යහපත් විදියට වටිනාකම් පිරුණු මනුස්සයෙක්
හැටියට සමාජයේ ඉන්නවා.
ඒ මනුස්සයා සමාජයට හා මිනිස්සුන්ට ගරු කරන
කෙනෙක් වෙනවා.

මේ පාඩම හරි අපූරුවට ඉගෙන ගත්ත
දියණිය කවුරු මොනවා කිව්වත්
තමන්ගේ ගමන යාමයි වැදගත් යන්න
තේරුම් ගත්තා...

*සබරගමු පළාත් ශිෂ්‍ය උපදේශන
හා මාර්ගෝපදේශන ඒකකය*
*H.R.D.S. හේමරත්න*